සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/6/EP/2/SB/AD
ඔබේ අංකය / உமது இல / Your No: ....................
දිනය / திகதி / Date: 2023.01.02

දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ,

ගම්පහ/ කළුතර/ ගාල්ල/ හම්බන්තොට/ මාතලේ/ නුවරඑළිය/ බදුල්ල/ මොණරාගල/ කෑගල්ල/ රත්නපුර/කුරුණෑගල/ පුත්තලම/ අනුරාධපුරය/ පොලොන්නරුව/ අම්පාර/ මඩකලපුව/ වව්නියාව/ මන්නාරම/ කිලිනොච්චිය/ මුලතිව්,

**<u>සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන පරිපාලනය, මෙහෙයවීම හා අරමුදල් පාලනය</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2019.10.22 දිනැති ලිපිය හා බැඳේ.

02. සමෘද්ධි වැඩසටහන සමග ඒකාබද්ධව මෙරට ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම සඳහා වස විසෙන් තොර දේශීය ආහාර නිෂ්පාදනයේ නියැලෙන සුළු පරිමාණ ව්‍යවසායකයින් මෙන්ම අනෙකුත් විවිධ නිෂ්පාදන සිදු කරනු ලබන සමෘද්ධි හා අඩු ආදායම්ලාභීන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමට ස්ථිරසාර වෙළඳපොලක් නිර්මාණය කරදීම හා මෙතුළින් මොවුන්ගේ ආදායම වර්ධනය හා ජීවන තත්ත්වය නංවාලීම සමෘද්ධි සුව බොජුන්හල් හා සමෘද්ධි අලෙවි මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ මූලික අභිප්‍රාය වේ.

03. මේ යටතේ ඔබ විසින් හඳුනාගත් ස්ථානවල සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අලෙවි සංවර්ධන අංශය මගින් ප්‍රතිපාදන ලබා දී ඇති අතර මේ වන විට ඒවා සාර්ථකව පවත්වාගෙන යාමට හෝ කඩිනමින් ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඔබ විසින් ගන්නා බව මාගේ විශ්වාසයයි.

04. මෙම මධ්‍යස්ථාන තිරසාර ලෙස පවත්වාගෙන යාමට පරිපාලන ව්‍යුහය ඉතා ශක්තිමත්ව පැවතිය යුතු අතර, ඒ සඳහා මෙම වැඩසටහනේ අනන්‍යතාවය හා අරමුණු සාක්ෂාත් වන අයුරින් පැහැදිලි විනිවිදභාවයකින් යුක්ත වූ ක්‍රමවේදයක් දියත් කළ යුතුව ඇත. මෙම ව්‍යාපෘතිය පවත්වාගෙන යාමේදී පැනනැගිය හැකි ගැටළු සඳහා කඩිනම් විසඳුම් ලබා ගැනීමටත් විවිධ බාධක හා අවහිරතා මගහරවා ගැනීමටත් මෙය ඉතා වැදගත් වේ.

05.මෙම සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන වඩාත් විධිමත්ව , සෞඛ්‍යාරක්ෂිත අයුරින් පවත්වාගැනීමෙන් හා ප්‍රදේශයට ආවේණික වූ ආහාර නිෂ්පාදන අලෙවි කිරීමෙන් පාරිභෝගිකයින්ගේ ආකර්ශණය දිනාගැනීමට හැකිවන අතර ඒ තුළින් මෙහි අලෙවි කටයුතු ඉහළ නංවාගත හැකිවේ.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011-288 |

06. එබැවින් උක්ත ලිපිය මගින් සමෘද්ධි සුවබොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන පරිපාලනය, මෙහෙයවීම හා අරමුදල් පාලනය සම්බන්ධයෙන් ඔබ වෙත ලබා දී ඇති උපදෙස් හා මගපෙන්වීම්වල යම් යම් සංශෝධනයන් සිදු කිරීමට සමෘද්ධි ජාතික සභාවෙන් අනුමැතිය ලැබී ඇති අතර, එම උපදෙස් ඇමුණුම-01 මගින් මේ සමඟ ඔබ වෙත ලබාදෙන බව කාරුණිකව දන්වමි.

07.මෙම ව්‍යාපෘතිය නිලධාරීන්ගේ පූර්ණ අධීක්ෂණය හා වගකීම තුළ ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන ව්‍යාපෘතියක් ලෙසින් පවත්වාගෙන යාම සුදුසු වන අතර මාසිකව ලබන ආදායමින් උපරිම 10% මුදලක් ප්‍රජා මූල සංවිධානයේ මෙම කාර්යය සඳහා සක්‍රීය අයුරින් දායක වන ප්‍රජා නායකයින්ගේ ගමන් වියදම් හෝ වෙනත් දීමනා සහ මෙහෙයුම් කටයුතු සඳහා ලබාදිම සුදුසු වේ. මෙම ව්‍යාපෘතිය සඳහා මේ සමඟ ලබාදී ඇති ඇමුණුම-02 ට අනුව ප්‍රාදේශීය සංවිධානය මගින් ව්‍යාපෘති වාර්තාවක් සකස් කර මහ සභාවෙන් අනුමත කර කඩිනමින් අලෙවි සංවර්ධන අංශය වෙත ලබාදීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

08. සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන සඳහා ප්‍රාදේශීය සංවිධානයේ සහ ප්‍රජා මූල බැංකු සමිතියේ වෙන වෙනම ලිපි ගොනු පවත්වාගෙන යාම සුදුසු වන අතර මේ තුලින් ව්‍යාපෘතියේ පසුවිපරම් කටයුතු වඩාත් පහසුවනු ඇත.

09.මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් භාණ්ඩ හා උපකරණ ප්‍රාදේශීය සංවිධානයේ ඉන්වෙන්ට්‍රිගත කිරීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් ලබාදෙන මෙන් කාරුණිකව දන්වමි.

10. සමෘද්ධි සුව බොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යන වසමේ වසම් භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී මෙම විෂය පිලිබඳ උනන්දුවක් සහ කැපවීමක් සහිත නිලධාරියෙකු වීම ඉතා වැදගත් බැවින් ඒ සඳහා සුදුසු නිලධාරියෙකු එම වසමට අනුයුක්ත කිරීම වඩාත් යෝග්‍ය වේ.

07. සමෘද්ධි සුවබොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන අලෙවි කටයුතු සඳහා ව්‍යවසායිකයින්ට ලබාදීමේදී ඔවුන් හා ගිවිසුම්ගත වීම අනිවාර්යය වන අතර,අදාළ වර්ෂාවසානයේදී ව්‍යවසායිකයින් එම ස්ථානයේ තවදුරටත් අලෙවි කටයුතු වල නිරතවේ නම් නැවත ගිවිසුම අළුත් කළ යුතුවේ. අදාළ ගිවිසුම්පත්‍රයේ පිටපතක් ඇමුණුම-03 මගින් මේ සමඟ ඔබ වෙත ලබාදීමට කටයුතු කරමි.

තවද දැනට ක්‍රියාත්මක සමෘද්ධි සුවබොජුන්හල් හා අලෙවි මධ්‍යස්ථාන වල යම් ගැටළු සහගත තත්ත්වයක් පවතී නම් ඒ සඳහා ඔබගේ පෞද්ගලික අවධානය යොමු කර කඩිනම් විසඳුම් ලබාදීමට මැදිහත් වන ලෙසද, මෙම ව්‍යාපෘතිය තව දුරටත් සංවර්ධනය සඳහා ඔබගේ අදහස් හා යෝජනා අප වෙත ලබා දෙන ලෙසද කාරුණිකව ඉල්ලමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

1.ලේකම්-කාන්තා ,ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය-කා.දැ.ගැ.පි
2.ප්‍රධාන අභ්‍යන්තර විගණක- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව-කා.දැ.ගැ.පි හා අ.ක.ස
3.නියෝජ්‍ය අධ්‍යක්ෂ-මහ සංගම්- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව-කා.දැ.ගැ.පි හා අ.ක.ස
4.සහකාර අධ්‍යක්ෂ-ප්‍රජා මූල සංවිධාන- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව-කා.දැ.ගැ.පි හා අ.ක.ස